# පාසල් සංගණනය - 2021
## අධ්‍යාපන අමාත්‍යාංශය

දශක පහකටත් වඩා දීර්ඝ ඉතිහාසයක් හිමි වාර්ෂික පාසල් සංගණනය අධ්‍යාපනය සම්බන්ධ තොරතුරු ලබාගන්නා ප්‍රධානතම මූලාශ්‍රය වේ. පාසල් පද්ධතියේ සියළුම සංවර්ධන වැඩසටහන් සඳහා පාදක කරගනු ලබන්නේ මෙම සංගණන තොරතුරු වේ.

සියළුම විදුහල්පතිවරුනි,

එබැවින් සංගණන තොරතුරු ඉතාමත් ම නිවැරදිව හා නියම කරනු ලබන කාල සීමාව තුළ දී සම්පූර්ණ කර ලබාදීමෙන් පාසල් පද්ධතියේ ඉදිරි අභිවෘද්ධිය සඳහා ඔබගේ වටිනා කාලය මේ සඳහා වැයකරමින් ඔබ වෙත අද දින පැවරුණු වගකීම නොපිරි හෙළා ම ඉටු කරනු අධ්‍යාපන අමාත්‍යාංශය අපේක්ෂා කරයි.

## ශිෂ්‍ය තොරතුරු උපලේඛනය (ST1) සම්පූර්ණ කිරීමේ අවධානයට ලක්කල යුතු කරුණු

### 2 කොටස - ශ්‍රේණි අනුව සිසුන් සංඛ්‍යාව, ඉගෙනුම් භාෂා මාධ්‍යය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව

1. ඔබ පාසලේ ඉගෙනුම් භාෂා මාධ්‍ය එකක්, දෙකක් හෝ තුනම හෝ තිබිය හැක. ඒ අනුව පාසලේ දැනට ක්‍රියාත්මක භාෂා මාධ්‍ය යටතේ ම පමණක් තොරතුරු ඇතුළත් කරන්න.
2. ද්වි මාධ්‍යයෙන් (ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් කිහිපයක්) ඉගැන්වීම සිදු කරනු ලබන පාසල් පහත කරුණු පිළිබඳව අවධානයට ලක් කලයුතු වේ.
   - ද්වි මාධ්‍ය/ ඉංග්‍රීසි මාධ්‍යයෙන් වෙනම පන්ති පවත්වාගෙන යන අවස්ථාවලදී පමණක් ඉංග්‍රීසි මාධ්‍ය යටතේ පන්ති ගණන සඳහන් කර එම සිසුන් සංඛ්‍යාව ඉංග්‍රීසි මාධ්‍ය යටතේ දක්වන්න.
   - නමුත් වෙනම පන්ති නොමැති අවස්ථාවලදී ඉංග්‍රීසි මාධ්‍ය යටතේ පන්ති සංඛ්‍යාව 0 ලෙස දක්වා එම සිසුන් සංඛ්‍යාව ඉංග්‍රීසි මාධ්‍ය යටතේ ම දැක්වියයුතු අතර එම සිසුන් නැවත සිංහල හෝ දෙමළ මාධ්‍ය යටතේ නොදැක්වීමට වගබලා ගත යුතු වේ.
3. 11 ශ්‍රේණිය (දෙවන වර) යටතේ සිසුන් සංඛ්‍යා දැක්විය යුත්තේ සත්‍ය වශයෙන් ම 11 ශ්‍රේණිය (දෙවන වර) සිසුන් පන්ති/යක් පවත්වා ගෙන යන්නේ නම් පමණි.
   - එහිදී භෞතිකව පන්තියක් පැවැත්වීම හා වෙනමම නාම ලේඛනයක් පවත්වා ගැනීම මෙන් ම කාල සටහනක් තිබීම සහ ඒ අනුව ගුරුවරුන් වෙන් කර තිබීම යන සියලුම කරුණු පැවතිය යුතු වේ.
   - පසුගිය වසරේ සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දී උසස් පෙළ සඳහා තවමත් ඇතුළත් නොවූ හෝ සාමාන්‍ය පෙළ අසමත් ව නිවෙස්වල සිටින සිසුන් මේ යටතේ දැක්වීමෙන් වලකින්න.
4. උසස් පෙළ විෂය ධාරා 2ක සිසුන් එකම පන්තියක සිටින අවස්ථාවල දී වැඩි සිසුන් සංඛ්‍යාවක් සිටින විෂය ධාරාව සඳහා පන්ති 1ක් ලෙස දක්වා අනෙක් විෂය ධාරාව සඳහා පන්ති 0 ලෙස දක්වා සිසුන් සංඛ්‍යාවන් අදාළ විෂය ධාරාවන් යටතේම දැක්විය යුතු වේ.

## 3 කොටස - ශ්‍රේණි අනුව සිසුන් සංඛ්‍යාව, උපන් වර්ෂය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව

- අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින තත්ත්වය ගෝලීය වශයෙන් සසඳා බැලීම සඳහා භාවිතයට ගන්නා ඉතා වැදගත් අනුපාත සහ අනුපාතික (Rates/Ratios) ගණනාවක් සැකසීම සඳහා මෙම කොටසින් ලබා ගන්නා සිසුන්ගේ වයස පදනම් වන මෙම වගුවේ දත්ත යොදා ගන්නා බැවින් හා පසුගිය වසරවල දී මෙම කොටස සැම පාසලක්ම නිවැරදිව ම සම්පූර්ණ කර නොතිබීම පොදු අඩුපාඩුවක් වූ බැවින් ඉතා ම නිවැරදිව මෙම කොටස සම්පූර්ණ කිරීමට මෙවර වග බලා ගත යුතු වේ.
- පහත වගුවේ දක්වා ඇති පරිදි සාමාන්‍යයෙන් 1ශ්‍රේණියේ සිසුන් ලෙස ඉගෙනුම ලබන්නේ 2015 හෝ 2016 වර්ෂ වල උපත ලද සිසුන් වේ. ඒ ආකාරයට ම අනෙක් ශ්‍රේණිවල ද නියමිත වයසේ පසුවන සිසුන් පහත වර්ණ කර පෙන්වා ඇති වර්ෂවල පමණක් විය යුතු අතර වෙනත් පසු වර්ෂයක කොටුවක දැක්විය යුත්තේ අසමත් වූ සිසුන් හෝ වයසින් වැඩි සිසුන් නම් පමණි. එසේ ම අදාළ වර්ෂයට පෙර වර්ෂයක කොටුවක දැක්විය යුත්තේ වයසින් අඩු සිසුන් නම් ම පමණි. නියමිත වයසේ සිසුන් පමණක් ඒ ඒ ශ්‍රේණිවල සිටී නම් වගුවේ විකර්ණය ඔස්සේ සටහන් වන බැවින් මේ පිළිබඳව අවධානය දක්වන්න.

| ශ්‍රේණිය | | | | උපන් වර්ෂය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 හෝ ඊට පෙර | එකතුව |
| 1 | | 2 | | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
| 1 | 1 ශ්‍රේණිය | 1.1 | පිරිමි | | | | | | | | | |
| | | 1.2 | ගැහැණු | | | | | | | | | |
| | | 1.3 | එකතුව | | | | | | | | | |
| 2 | 2 ශ්‍රේණිය | 2.1 | පිරිමි | | | | 3 | | | | | |
| | | 2.2 | ගැහැණු | | | | | | | | | |
| | | 2.3 | එකතුව | | | | | | | | | |
| 3 | 3 ශ්‍රේණිය | 3.1 | පිරිමි | | | | | | | | | |
| | | 3.2 | ගැහැණු | | | | | | | | | |
| | | 3.3 | එකතුව | | | | | | | | | |
| 4 | 4 ශ්‍රේණිය | 4.1 | පිරිමි | | | | | | | | | |
| | | 4.2 | ගැහැණු | | | | 2 | | | | | |
| | | 4.3 | එකතුව | | | | | | | | | |
| 5 | 5 ශ්‍රේණිය | 5.1 | පිරිමි | | | | | | | | | |
| | | 5.2 | ගැහැණු | | | | | | | | | |
| | | 5.3 | එකතුව | | | | | | | | | |

වයස අවුරුද්දක් වැඩිමල් සිසුන් 3ක් 2 ශ්‍රේණියේ සිටී

වයස අවුරුද්දක් අඩු සිසුවියන් 2ක් 4 ශ්‍රේණියේ සිටී

## <u>7 කොටස - 2021 වර්ෂයේදී පාසලට ඇතුළත් වූ නවක, අස් වී ගිය, පාසලට නොපැමිණෙන සහ 2020 අවසාන වාර විභාගය අසමත් වූ සිසුන් සංඛ්‍යාව</u>

- 2021 වර්ෂයේදී (සංගණන දිනය දක්වා) ඔබේ පාසලට නවක සිසුන් ලෙස ඇතුළත් වූ ( නව ඇතුළත්වීමේ අංකයක් නිකුත් කරන ලද) සිසුන් ඇතුළත් වූ ශ්‍රේණිය අනුව තීරු අංක 2, 3 සහ 4 යටතේ දක්වන්න. එකම පාසලේ ප්‍රාථමික අංශයේ සිසුන් 6 ශ්‍රේණියට ඇතුළත් කිරීම මෙහිදී සලකනු නොලැබේ.
- එම කාලසීමාව තුළදී අස්වීම් සහතික ලබා පිටව ගිය සිසුන් ශ්‍රේණිය අනුව තීරු අංක 5, 6 සහ 7යටතේ දක්වන්න.
- 2020 වර්ෂයේදී පැවති ගෝලීය කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ක්‍රමානුකූලව පාසල් නොපැවත් වූ බැවින් 2021 වර්ෂයේදී (සංගණන දිනය දක්වා) පාසලට නොපැමිණි සිසුන් පිළිබඳ කොටස (තීරු අංක 8, 9 සහ 10) මෙවර සංගණනයේ දී සම්පූර්ණ කල යුතු නැත.
- 2020 වර්ෂයේ අවසාන වාර විභාගය නොපැවැත් වූ බැවින් අසමත් වූ සිසුන් සංඛ්‍යාව පිළිබඳ කොටස (තීරු අංක 11, 12 සහ 13) මෙවර සංගණනයේ දී සම්පූර්ණ කල යුතු නැත.

## <u>8 කොටස - ඒ ඒ ශ්‍රේණිවල සිසුන් සංඛ්‍යාව හදාරනු ලබන විෂයයන් ඉගෙනුම් භාෂා මාධ්‍ය අනුව</u>

- පෙළපොත් මුද්‍රණයට සහ විවිධ පර්යේෂණ කටයුතු සඳහා ඒ ඒ විෂයය හදාරනු ලබන සිසුන් සංඛ්‍යා පිළිබඳ සංඛ්‍යාලේඛන සඳහා අති විශාල ඉල්ලුමක් පවතින බැවින් මෙම කොටස ඉතාමත් සුපරික්ෂාකාරීව සම්පූර්ණ කිරීමට වග බලා ගන්න.
- මෙහි විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අ.පො.ස. (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) සියලු විෂයයන් දක්වා ඇති බැවින් ඔබ පාසලේ සිසුන් ඉගෙන ගනු ලබන විෂයයන් ඉදිරියේ ම පමණක් සිසුන් සංඛ්‍යාවන් ඇතුළත් කිරීමට වග බලා ගන්න.
- ඒ ඒ ශ්‍රේණියට අදාළව ඒ ඒ විෂයයන් හදාරනු ලබන සිසුන් සංඛ්‍යාවන් අදාළ භාෂා මාධ්‍ය යටතේ ඇතුළත් කරන්න.
- වැරදි පේළියක තොරතුරු ඇතුළත්වීම මඟ හරවා ගැනීමට ඒ ඒ අංශවල හෝ ශ්‍රේණිවල ඉගැන්වීම් නොකරන විෂයන් ඉදිරියේ ඇති කොටු පැන්සලෙන් තනි ඉරකින් කපා දමන්න.

## <u>9 කොටස - විභාග තොරතුරු (2020 වර්ෂය)</u>

### 9A කොටස: 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග තොරතුරු

- ඔබ පාසලේ මෙම වසරේ (2021) සහ පසුගිය වසරේ (2020) **5 ශ්‍රේණිය** සඳහා පන්ති පැවතියේ නම් පමණක් 9.1 වගුව සම්පූර්ණ කරන්න.
- 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දිස්ත්‍රික් කඩඉම් ලකුණට වැඩියෙන් ලබා ගත් සිසුන් පමණක් **සමත් වූ සිසුන්** ලෙස සලකා තොරතුරු ඇතුළත් කරන්න.

### 9B කොටස: අ.පො.ස (සා/ පෙළ) විභාග තොරතුරු-2020

- ඔබ පාසලේ පසුගිය වසරේ (2020) 11 **ශ්‍රේණිය** සඳහා පන්ති පැවතියේ නම් පමණක් 9.2 වගුව සම්පූර්ණ කරන්න.
- විභාග දෙපාර්තමේන්තුවේ නිර්ණායක අනුව **උසස් පෙළට සුදුසුකම්** ලැබූ සිසුන් පිළිබඳ තොරතුරු ඇතුළත් කරන්න.

**<u>10 කොටස - ශිෂ්‍යාධාර ලබන සිසුන් සංඛ්‍යාව</u>**

- ඔබ පාසලේ 6 ශ්‍රේණියෙන් ඉහළ ශ්‍රේණි සඳහා පන්ති පවතී නම් සහ එම එක ශ්‍රේණියක හෝ 5වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල මත ශිෂ්‍යාධාර ලබන සිසුන් සිටී නම් මෙම 10.1 වගුව සම්පූර්ණ කරන්න.

**<u>11 කොටස - සාමාන්‍ය පන්ති වල ඌනතා සහිත සිසුන් පිළිබඳ තොරතුරු</u>**

- ඔබ පාසලේ පවතින සියලුම ශ්‍රේණිවල ඒ ඒ ශ්‍රේණි සඳහා පවතින **සාමාන්‍ය පන්තිවල** සිටින ඌනතා සහිත සිසුන් සංඛ්‍යාව 11A වගුවේ සඳහන් කර ඇති ඌනතාව අනුව පිරිමි හා ගැහැණු සිසුන් සංඛ්‍යාවන් අදාළ තීරුවල දක්වන්න.

- ඌනතා එකකට වඩා ඇති සිසුන් බහුවිධ ඌනතා යටතේ ඇති තීරු අංක 2 සහ 3 හි සඳහන් කරන්න. (උදා. **කථන ඌනතා සහ දෘෂ්ටි ඌනතා ඇති සිසුවෙක් සිටී නම් බහුවිධ ඌනතා යටතේ ඇතුලත් කරන්න.**)
- ඌනතා කිහිපයක් ඇති සිසුන් කිසිම විටක ද්වි ගණනයකට/ කිහිපවරක් ම ගණනයට ලක්වන පරිදි එකම සිසුවා ඌනතා කිහියක් යටතේ දැක්වීමෙන් වලකින්න.

- මෙහි සඳහන් ඌනතාවලට අමතරව වෙනත් සැලකිය යුතු ඌනතා/වක් ඇත්නම් පමණක්වෙනත් යටතේ දක්වන්න. ඌනතා කිසිවක් නොමැති සිසුන් කිසිවිටෙකත් වෙනත් යටතේ දැක්වීමෙන් වලකින්න.

- 11A වගුවේ සඳහන් කර ඇති ඌනතා සහිත පිරිමි හා ගැහැණු සිසුන් උපන් වර්ෂය අනුව 11B වගුව සම්පූර්ණ කරන්න.

ඌනතා වල අර්ථ දැක්වීම් හා ඉංග්‍රීසි වචන ඔබගේ පහසුව සඳහා අවසන් පිටුවේ දක්වා ඇත.

**<u>12 කොටස - විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ඇති විශේෂ අධ්‍යාපන ඒකකවල සිසුන් පිළිබඳ තොරතුරු</u>**

- ඔබ පාසලේ **<u>විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ඇති විශේෂ අධ්‍යාපන ඒකකයක්</u>** පවතී නම් පමණක් මෙම 12 කොටස සම්පූර්ණ කරන්න.
- **12A** වගුව යටතේ විශේෂ ඒකකයේ සිසුන් සංඛ්‍යාව ඉගෙනුම් භාෂා මාධ්‍යය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ද, 12**B** වගුව යටතේ විශේෂ ඒකකයේ සිසුන්ගේ උපන් වර්ෂය අනුවද, 12**C** වගුව යටතේ විශේෂ ඒකකයේ සිසුන්ගේ පවතින ඌනතා අනුවද සිසුන් සංඛ්‍යාවන් දක්වන්න.
- ඌනතා සම්බන්ධයෙන් 12**C** වගුව පිරවිය යුත්තේ ද 11 කොටසේ ලබාදුන් උපදෙස් අනුව වේ.

**ශ්‍රවණ ඌණතා** (Hearing Impairment)

**පූර්ණ බිහිරි**

කිසිදු ශබ්දයකට ප්‍රතිචාර දැක්වීමට නොහැකි සම්පූර්ණයෙන්ම ඇසීම නොමැති සිසුන්.

**අර්ධ බිහිරි**

පරිසරයේ සාමාන්‍ය ශබ්දවලට ප්‍රතිචාර දැක්වීමට නොහැකි එහෙත් සවන් වහල් (Hearing Aid) භාවිතා කිරීමෙන් ඇසීම වර්ධනය කර ගත හැකි සිසුන්.

**දෘෂ්ටි ඌණතා** (Visual Impairment)

**පූර්ණ අන්ධ**

සම්පූර්ණයෙන්ම පෙනීම නොමැති, අධ්‍යාපනය සඳහා බ්‍රේල් ක්‍රමය භාවිතා කල යුතු සිසුන්.

**ඌන දෘෂ්ඨික**

සුදුසු ඇස් කණ්නාඩි භාවිතා කිරීමෙන් සාමාන්‍ය තත්ත්වයට පෙනීම ලබා ගත නොහැකි නිරන්තරයෙන් පෙනීමේ ගැටළු මතුකරන සිසුන් (සුදුසු ඇස් කණ්නාඩි භාවිතා කර සාමාන්‍ය පෙනීම ලබාගත හැකි සිසුන් ඇතුලත් නොකරන්න).

**කථන ඌණතා** (Speech Language Difficulties)

සිය අදහස් වාචිකව ප්‍රකාශ කිරීමේදී දැඩි ආයාසයක් ගන්නා (ගොත ගැසීම) උච්චාරණ දෝෂ සහ කථන හා භාෂණ පසුබටතාවන් දක්වන සිසුන්.

**ඩිස්ලෙක්ෂියා** (Dyslexia)

කියවීම, ලිවීම හා ගණිතය පිළිබඳ දිගු කාලීනව සිසුන් තුළ දක්නට ලැබෙන සුවිශේෂ ගැටළු.

**බුද්ධිමය ඌනතා** (Intellectual Impairment)

මොළයට සිදු වූ හානියක් නිසා සම වයසේ සාමාන්‍ය දරුවකුගේ ක්‍රියාකාරකම්වලට වඩා වසර 3 ක් හෝ ඊට වැඩි ප්‍රමාදයක් දක්වන සිසුන් (සාමාන්‍ය හේතු මත සෙමෙන් ඉගෙන ගන්නා සිසුන් මීට අයත් නොවේ).

**ශාරීරික ඌනතා** (Physical Disability)

ශාරීරික අවයව වල අඩුපාඩු හෝ අසාමාන්‍ය පිහිටීම් ඇති සිසුන්.

**අපස්මාරය** (Epilepsy)

වෛද්‍යවරුන් විසින් හඳුනාගෙන ඇති/නැති අපස්මාර රෝගී තත්ත්වය සහිත සිසුන්.

**චිත්තවේගී ගැටළු** (Behaviour Difficulties)

පන්ති කාමරය තුළ අධි ක්‍රියාකාරී, කලහාකාරී, ආක්‍රමණශීලී, හුදකලා හෝ මනෝ වික්ෂිප්ත තත්ත්වයන් නිසා අසාමාන්‍ය චර්යා ලක්ෂණ පෙන්නුම් කරන සිසුන්.

**බහුවිධ ඌනතා** (Multiple Disabilities)

ඉහත සඳහන් ඌනතා තත්ත්වයන් දෙකක් හෝ ඊට වැඩි ගණනක් දක්නට ලැබෙන සිසුන්.

**වෙනත්** (Other)

මෙහි සඳහන් කර නොමැති වෙනත් ඌනතාවක් හෝ විශේෂ ගැටළුවක් දක්නට ඇති සිසුන්.